# 'මාක්පෙඩ්' කියන්නෙ මොකක්ද? කරන්නෙ කුමක්ද?

**(සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංවිධානයේ සාමාන්‍යාධිකාරී එරික් ජයකොඩි මහතා සමග කළ සාකච්ඡාවක් අනුසාරයෙනි.)**

**ප්‍ර: මාක්-පෙඩ් කියන කෙටි නමින් හැඳින්වෙන "සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය" කියන්නෙ මොකක්ද?**

උ: විවිධ සේවා සමුපකාර සමිති පාරිභෝගිකයින්ගේ ඕනෑ එපාකම් ඉටු කර දෙනව. ඒ කටයුතු කරන්න විවිධ සේවා සමුපකාර සමිතිවලට රථවාහන ඕනෑ, සල්ලි ඕනෑ, පරිභෝගිකයින් අතර බෙද හරින්න බඩුබාහිරාදිය ඕනෑ. මෙවා ලබා ගන්න පහසුකම් විවිධ සේවා සමුපකාර සමිතිවලට තියෙන්න ඕනෑ. ඒ කියන්නෙ, සමුපකාර සමිති වල අවශ්‍යතා සපුරාලන ලොකු සංවිධානයක් තියෙන්නෙ ඕනෑ. 1952 දී සතොස කියන සමුපකාර තොග වෙළඳ සංස්ථාව ආරම්භ කළේ සමුපකාරිකයින්ගෙ මවු සංවිධානයක් හැටියටයි. වැඩ කටයුතු කරගෙන යද්දි සතොස ක්‍රමයෙන් සමුපකාරිකයන්ගෙ සමුපකාරයක් හැටියට වැඩ කරනවාට වඩා රාජ්‍ය සංස්ථාවක තත්ත්වයට වැටෙන්නට පටන් ගත්ත. සතොස සමුපකාර අංශයෙන් ඉවත් වීමෙන් ඇති වුන පරතරය පිය වන්න තමයි, 1968 දී විතර සමස්ත ලංකා සමුපකාර පරිභෝගික සංගමය ආරම්භ කළේ. මේ සංවිධානය, සුළු වෙන් වැඩ ආරම්භ කරගෙන යද්දි ඒ වෙනුවට 1973 දී 'සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය' පිහිටෙව්වා. කෙටියෙන් කියනව නම් මේ සංවිධානය, සමුපකාරිකයන්ගෙ මවු සංවිධානයක්.

**ප්‍ර: මාක්-පෙඩ් එක ආරම්භ කළේ මොන අදහසක් ඇතුවද?**

උ: මාක්-පෙඩ් අලෙවි සංවිධානයක්. සමාජික සමුපකාර සමිතිවල, පාරිභෝගිකයින්ගෙ ගොවිතැන් කටයුතු, යතුන් ඇති කිරීම, කර්මාන්ත ආදියට ඕනෑ කරන බඩුබාහිරාදිය, අමු ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ පිටරටින් ගෙන්වා හෝ මිළයට ගෙන සපයා දීම හා ඒවා සාමාජික සමිති අතර බෙද හැරීම සමුපකාර අලෙවි සංගමයේ එක පරමාර්ථයක්. සංගමයේත්, සාමාජික සමිතිවලත් කෘෂිකාර්මික හා කාර්මික නිපැයුම් රැස් කිරීම, ගබඩා කිරීම, සකස් කිරීම, අලෙවි කිරීම හා අපනයනය කිරීමත් සමුපකාර අලෙවි සංගමය සතු ප්‍රධාන තම වගකීමක්. මීට අමතරව මාක්-පෙඩ් සංවිධානය, සාමාජික සමිතිවල කාර්යක්ෂම පැවැත්මට ඕනෑ කරන අලෙවි තොරතුරු ආදිය සපයා දීමෙන් ඒවායේ දියුණුවට උදව්කරනව. සාමාජික සමිති වල නිෂ්පාදන නියමිත මිළකට අලෙවි කිරීම සඳහා ඕනෑ කරන මුදල් උපයා ගැනීමටද කටයුතු කරන මේ සංවිධානය, සමුපකාර අභ්‍යාස ආයතනයේ සහයෝගයද ඇතුව සාමාජික සමිති වල සේවකයින්ට පුහුණුවක් දීමටත් වැඩපිළිවෙලක් සකස් කර තියෙනව.

**ප්‍ර: සමුපකාර සමිතිවල මවු සංවිධානයක් හැටියට කටයුතු කරන්නෙ මාක්-පෙඩ් විතරද?**

උ: 1973 සමුපකාර ප්‍රතිසංවිධාන කටයුතු වලදී අදහස් කළේ, විවිධ සේවා සමුපකාර සමිතිවල මවු සංවිධානය හැටියට උතුරු පළාතෙ තිබුණ සංගමයත්, සමස්ත ලංකා සමුපකාර පාරිභෝගික සංගමයත්

ඒකාබද්ධ කළයුතු බවයි. මීට අමතරව එවකට තිබුණ කෘෂිකාර්මික නිෂ්පාදක යින්ගේ සංගමයත් එක් කරල මාක්-පෙඩ් කියන සංවිධානය ඇති කළා.

**ප්‍ර: මාක්-පෙඩ් සංවිධානය මුලින්ම වැඩ කටයුතු ආරම්භ කළේ කොහොමද?**

උ: සංවිධානය ආරම්භයේදීම එළවළු අලෙවිය ගැන සෑහෙන අත්දැකීමක් තිබුණ නිසා මේ අංශය ගැන වැඩි සැළකිල්ලක් දක්වූවා. සෑහෙන ලාබයක් ඇතුව එළවළු අලෙවිය පවත්වාගෙන යන්න පුළුවන් බව මාක්-පෙඩ් සංවිධානයට ඒත්තු ගියා. 1973 දී මාසයකට රු. 45,000/- ක පමණ එළවළු අලෙවි කල අලෙවි සංවිධානය දැන් මාසයකට රුපියල් ලක්ෂ දහයක විතර එළවළු ව්‍යාපාරික කටයුතු කරනව.

**ප්‍ර: සංවිධානයට එළවළු ලැබෙන්නෙ කොහෙන්ද?**

උ: අතර මැදියන්ගෙන් එළවළු මිළයට ගැනිමෙ ක්‍රමය මාක්-පෙඩ් අනුගමනය කරන්නෙ නෑ. සංවිධානයේ සාමාජික සමුපකාර සමිති එළවළු රැස් කිරීමේ නියෝජිතයින් හැටියට කටයුතු කරනව. මාක්-පෙඩ් එක සෑමවිටම උත්සාහ කරන්නෙ කෙළින්ම නිපදවන්නන්ගෙන් එළවළු ලබා ගැනීමටයි.

**ප්‍ර: මේ එළවළු අලෙවි කරන්නේ කාටද?**

උ: හෝටල්වලට, නැව්වලට, නොයෙකුත් ආයතනවලට වගේම හමුදාවලටත් එළවළු අලෙවි කරනව. ඉතිරි හරිය තොග වශයෙන් සාමාන්‍ය වෙළෙන්දන්ට විකුණනව.

**ප්‍ර: එළවළු අලෙවියෙහිදී මාක්-පෙඩ් සංවිධානයෙන් නිෂ්පාදකයින්ට සිදු වන සේවය මොකක්ද?**

උ: සංවිධානය නිෂ්පාදකයින්ගෙන් එළවළු ලබා ගන්නෙ සාධාරණ මිළකටයි. එහෙම වුනහම නිෂ්පාදකයාට ලාබයක් ලැබෙනව. ප්‍රවාහනය, එළවළු ඇහිරීම ආදී කටයුතු සඳහා සංවිධානය වෙන් කරන්නෙ සියයට 6 ක් විතරයි. ඉතිරි මුදල් සියල්ල නිෂ්පාදකයා අතට ලැබෙනව.

**ප්‍ර: එළවළු මිළයට ගන්නෙ කෙළින්ම නිෂ්පාදකයාගෙන්ද නැත්නම් විවිධ සේවා සමුපකාර සමිති මගින්ද?**

උ: මාක්-පෙඩ් සංවිධානයට ප්‍රාදේශීය වශයෙන් ගබඩා පහසුකම් ආදිය නැහැ. ඒක නිසා ප්‍රදේශයේ විවිධ සේවා සමුපකාර සමිතිවලට එළවළු රැස් කිරීමේ වගකීම භාර කරල, ඒ සමිතිවලට සියයට එකක මුදලක් දෙනව. මේ විදියට සාමාජික සමුපකාර සමිතිවල කටයුතු දියුණු කරන්න පුළුවනි.

**ප්‍ර: සංවිධානයෙන් ගොවීන්ට සිදුවන වෙන සේවාවන් මොනවාද?**

උ: මාක්-පෙඩ් සංවිධානය අළුත් යෝජනා ක්‍රම ගණනාවක් දැන් ආරම්භ කරල තියෙනව. ඉන් එකක් තමයි, සාමාජික සමුපකාර සමිතිවලට ණය ක්‍රමයක් අනුව පෝර දීම. ගොවීන්ට මේ සමුපකාර වලින් තමන්ගෙ පෝර ප්‍රමාණය කලට වේලාවට ලබා ගන්න පුළුවනි. වී, මුං ඇට, කුරක්කන්, බඩ ඉරිඟු, සෝගම් ආදී ආහාර ද්‍රව්‍ය වවන්න මේ විදිහට පෝර දෙන වැඩපිළිවෙලක් මාක්-පෙඩ් සංවිධානය හම්බන්තොට ආරම්භ කළා. ගොවීන් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය මිළයට ගැනීමට විශාල වශයෙන් මුදලුත් මාක්-පෙඩ් සංවිධානය සාමාජික සමිතිවල ණයට දෙනව.

**ප්‍ර: එළවළු අලෙවිය හුඟක්දුරට තියෙන්නෙ පෞද්ගලික වෙළෙන්දො අතෙයි. එවැනි තත්ත්වයක් යටතෙ සංවිධානය ගොවීන්ට සේවය කරන්නෙ කොහොමද?**